# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2021/33 - 2017 ජුනි මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2017.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

උතුරු පළාතේ පළාත් සභාවේ 2017 වසරේ අංක 01 දරන උසාවි දඩ මුදල් හා දණ්ඩන මුදල් හැරවීමේ ප්‍රඥප්තිය

2014 වසරේ අංක 01 දරන උතුරු පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ අය කරනු ලබන අධිකරණයක් විසින් පනවා රැස් කරනු ලබන දඩ මුදල් හා දණ්ඩන මුදල් උතුරු පළාතේ පළාත් පාලන ආයතන වලට හුවමාරු කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාව විසින් පහත පරිදි මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය උතුරු පළාතේ පළාත් සභාවේ 2017 වසරේ අංක 01 දරන උසාවි දඩ මුදල් හා දණ්ඩන මුදල් හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ එකඟතාවය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය. — ලුහුඬු නාමය

02. 2014 වසරේ අංක 01 දරන උතුරු පළාතේ මුදල් ප්‍රඥප්තියේ නියමයන් ප්‍රකාරව, පළාතේ පිහිටි අධිකරණයන් විසින් පනවනු ලබන දඩ මුදල් හා දණ්ඩන මුදල් පළාත් සභාව විසින් රැස් කරනු ලැබූ විටෙක, පළාත් සභාව ඉහත කී පරිද්දෙන් කිනම් වර්ෂය සඳහා එම දඩ මුදල් හා දණ්ඩන මුදල් රැස් කරනු ලැබුවේ ද, එම වර්ෂයේ දෙසැම්බර් තිස්එක් වැනි දින සිට වර්ෂ පහක් ඇතුළත වූ කාලයට, පළාතේ මුදල් විෂය භාර අමාත්‍යවරයාට අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විසින් ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත, එකී පළාත් පාලන ආයතනයට එවැනි දඩ මුදලෙන් හා දණ්ඩන මුදලෙන්, මුදල් හැරවීම කරගත හැකි වන්නේය. කෙසේ වෙතත්, ඉල්ලීම් ඉදිරිපත් කර මාස හයක කාලයක් ඇතුළත හැරවීම සිදු කළ යුතු ය. — උසාවි දඩ මුදල් හා දණ්ඩන මුදල් හැරවීම

03. දෙවැනි වගන්තිය යටතේ යම් හිමිකම් පෑමක්, එවැනි ගෙවීම කළ දිනය, පළාත් සභාවට අදාළ අධිකරණය විසින් එම මුදල් ප්‍රේෂණය කළ දිනය, එම ලේඛනය පිළිබඳව විශේෂිත සටහන් සමඟ එවැනි දඩ මුදල් හා දණ්ඩන මුදල් කුමන ආඥපනත යටතේ නැතහොත් පනත යටතේ පනවනු ලැබුවේ ද, ඒ ගෙවීම් ලේඛනය ආඥපනත යටතේ නැතහොත් පනත සඳහන් කර හිමිකම් පෑම මගින් නිශ්චිතව දක්වන ලද එම දඩ මුදල් හා දණ්ඩන මුදල් පනවා අය කරනු ලැබූ අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් හෝ ඒ වෙනුවෙන් ඔහු විසින් නම් කරනු ලැබූ යම් වෙනත් නිලධාරියෙකු විසින් සහතික කර ඇත්නම් මිස වලංගු නොවේ. — අධිකරණ රෙජිස්ට්‍රාර්ගේ සහතිකය



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අර්ථ නිරූපනය

04. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වූවහොත් මිස, ''ප්‍රධාන පරිපාලන නිලධාරියා '' යනු

(අ) මහ නගර සභාව සම්බන්ධයෙන් මහ නගර සභාවේ කොමසාරිස්වරයා යන්නෙන් ද,

(ආ) නගර සභාව හා ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් ලේකම්වරයා යන්නෙන් ද,

අදහස් වේ.

''පළාත් පාලන ආයතනය'' යන්නෙන්, යම් මහා නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, සිදු කරන හා ඉටු කරන බලතල වලට, කාර්යවලට හා කර්තව්‍ය වලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ පිහිටුවන ලද කිසියම් අධිකාරියක් ඊට ඇතුළත් වේ.

''පළාත'' යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත අදහස් වේ.

''පළාත් සභාව'' යන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාව අදහස් වේ.

යම් අසංස්ථිතියක් ඇති වුවහොත් දෙමළ භාෂා පාඨය බල පැවැත්වෙන බව.

05. මෙම ප්‍රඥප්තියේ දෙමළ භාෂා පාඨය, සිංහල භාෂා පාඨය සහ ඉංග්‍රීසි භාෂා පාඨය අතර යම් අසංස්ථිතියක් පවතින විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

06 -519

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.